# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2381/16 - 2024 අප්‍රේල් මස 22 වැනි සඳුදා - 2024.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත

2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 4 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින් මෙම නිවේදනය මඟින් 2024 ජනවාරි මස 12 දිනැති අංක 2366/33 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය සහ 2024 පෙබරවාරි මස 02 දිනැති අංක 2369/42 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(1) "2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත" යන වචන සහ ඉලක්කම් යෙදී ඇති සෑම ස්ථානයකම, ඒ වෙනුවට, "2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීම ; සහ

(2) "රෙගුලාසි" සහ "නියමය" යන වචන යෙදී ඇති සෑම ස්ථානයකම, ඒ වෙනුවට, "නියෝග" යන වචනය ආදේශ කිරීම.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 අප්‍රේල් මස 22 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 04 - 0198


1A - PG 6704 — 404 (2024/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*